මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2015

Primary Piriven Mid Year Term Test - 2015

5 වසර / Grade 5

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**ත්‍රිපිටක ධර්මය I**
**Tripitaka Dharmaya I**

කාලය : පැය තුනයි
Time : Three hours

❖ I කොටසටත් II කොටසින් ප්‍රශ්න 05 කටත් පිළිතුරු සපයන්න.

## I කොටස

01.**පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

i) කර්මය හඳුන්වන පාඨය ලියන්න.

ii) පංච නීවරණ ධර්ම නම් කරන්න.

iii) සමථයානික විදර්ශනායානික දෙකෙහි අර්ථ දක්වන්න.

iv) අභිධර්මයේ විසය රූප කීය ද? ඒවා නම් කරන්න.

v) සතර සංවර සීලය නම් කරන්න.

vi) සංඝාදිසේස කීයද?

vii) ආභිසමාචාරික ශික්ෂා සඳහන් වන විනය ග්‍රන්ථ මොනවා ද?

viii) ත්‍රිවිධ ශික්ෂා නම් කරන්න.

ix) ප්‍රසාද රූපය හඳුන්වන්න.

x) උපාදාය රූප ගණනින් කෙතෙක් ද? (ලකුණු 4x10= 40)

## II කොටස

02. i) රූප යන්නෙහි අර්ථය දක්වන්න.

ii) රූප විග්‍රහ කරන පස් ආකාරය නම් කරන්න.

iii) ඉන් එකක් පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 3+3+6=12)

03. i) කෙලෙස් ප්‍රහීණ වන ක්‍රම 3 කි. නම් කරන්න.

ii) ඉන් එකක් හඳුන්වන්න.

iii) සමථ භාවනාවෙන් ලද හැකි ආනිසංස මොනවාදැයි දක්වන්න.

(ලකුණු 3+3+6=12)

04. i) පංචවිධ සන්ධි නම් කරන්න

ii) ඉන් එකක් පැහැදිලි කරන්න.

iii) ආනාපාන සති භාවනාව වඩන පිළිවෙල පැහැදිලි කරන්න.

(ලකුණු 3+3+6=12)

05. i) ''පාරාජික'' යන්න හඳුන්වන්න.

ii) ''යො පන භික්ඛු භික්ඛූනං සික්ඛා සාජීව....'' යන මේ පාඨය සම්පූර්ණ කරන්න.

iii) එහි අර්ථය හා නිදාන කථාව කෙටියෙන් දක්වන්න.

(ලකුණු 3+3+6=12)

06. i) සංඝාදිසේස යන වචනයෙහි අර්ථ දක්වන්න.

ii) එම ඇවතකට පත් භික්ෂුව පිරිසිදු වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 4+8=12)

07. මින් 02 කට කෙටි සටහන් ලියන්න.

i) විදර්ශනා භාවනා

ii) මහාභූත රූප

iii) පල්ලඞ්කං ආභුජිත්වා

iv) ලක්ඛණූපනිජ්ඣාන

(ලකුණු 6+6=12)

The National e-learning Portal for The General Education

# මූලික පිරිවෙන් මධ්‍ය වාර පරීක්ෂණය - 2015

## Primary Piriven Mid Year Term Test - 2015

5 වසර / Grade 5

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**ත්‍රිපිටක ධර්මය II**
**Tripitaka Dharmaya II**

කාලය : පැය තුනයි
Time : Three hours

❖ I කොටසටත් II කොටසේ ප්‍රශ්න 04 කටත් පිළිතුරු සපයන්න.

## I කොටස

01. **කෙටි පිළිතුරු සපයන්න.**

i) 'තුම්හේහි කිච්චං ආතප්පං - අක්ඛාතාරෝ තථාගතා' යන්නෙහි අර්ථය ලියන්න.

ii) 'ගාමේ වා යදි වාරඤ්ඤේ' යන ගාථාව දේශනා කළේ කවුරුන් අරහයා ද?

iii) 'උට්ඨාන විරියාධිගතේහි' යන්නෙහි අදහස ලියන්න.

iv) මුගලන් මහරහතන් වහන්සේ ලැබූ අග තනතුර කුමක් ද?

v) සතර කර්ම ක්ලේශ නම් කරන්න.

vi) සැරියුත් මහ රහතන් වහන්සේගේ විශිෂ්ට ගුණ සමුදාය අතුරෙන් දෙකක් ලියන්න.

vii) සිවුවන ධර්ම සංගායනාව පැවැත්වූ ස්ථානය හා ඒ සඳහා ගතවූ කාලය ලියන්න.

viii) දස බල ඥාණ අතුරෙන් හතරක් ලියන්න.

ix) කාලාම සූත්‍රයේ සඳහන් කරුණු අතුරෙන් හතරක් ලියන්න.

x) සතර සංග්‍රහ වස්තුව නම් කරන්න.

(ලකුණු 4x10= 40)

## II කොටස

02. i) බුද්ධ චරිතයෙන් පිළිබිඹු වන විශිෂ්ට ලක්ෂණ හතරක් ලියන්න

ii) බුදුන් වහන්සේගේ මානුෂික ගුණාංග හතරක් නම් කරන්න.

iii) බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨ සමාජ ශෝධකයෙකි. උදාහරණ සහිතව විමසන්න.

(ලකුණු 4+4+7=15)

The National e-learning Portal - The General Education

03. i) ''පාපොපි පස්සති භද්‍රං'' යන ගාථාව සම්පූර්ණ කරන්න.

ii) එහි අර්ථය ලියන්න.

ii) කර්මය යනු කුමක්දැයි යන්න හා එහි ප්‍රභේද පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(ලකුණු 3+4+8=15)

04. i) සදිසා නම් කරන්න.

ii) භෝග විනාශ මුඛ නම් කරන්න.

iii) යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳව සිගාලෝවාද සූත්‍රය ඇසුරින් විස්තරයක් කරන්න.

(ලකුණු 4 +4+7=15)

05. i) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ එන මෙලොව දියුණුවට හේතුවන කරුණු මොනවාද ?

ii) එම සූතයේ දැක්වෙන පරලොව දියුණුවට හේතුවන කරුණු මොනවාද ?

iii) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයට අනුව දෙලොව දියුණුව ඇතිකර ගන්නා ආකාරය විස්තර කරන්න.

(ලකුණු 4 +4+7=15)

06. i) බුදුරදුන්ගේ පිහිට ලැබුවන් හතර දෙනෙකු නම් කරන්න.

ii) ඉන් එක් අයෙකු පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

iii) ''යො ගිලානං උපට්ඨහෙය්‍ය සො මං උපට්ඨහෙය්‍ය'' මෙම කියමන උදාහරණ සහිතව විස්තර කරන්න.

(ලකුණු 4 +4+7=15)

07. i) ඛේමා තෙරණියට ලැබූ අගතනතුර කුමක් ද?

ii) ඛේමා බිසව සෝවාන් වූයේ කිනම් සූත්‍රය ඇසීමෙන් ද?

iii) ඛේමා තෙරණියගේ චරිතය පිළිබඳ විස්තරයක් කරන්න.

(ලකුණු 4 +4+7=15)